
8 ශ්‍රේණිය - 11 පාඩම

# ප්‍රජනක සෞඛ්‍ය රැක ගනිමු.

## පුරුෂ ප්‍රජනක පද්ධතිය




- පිරිමි දරුවෙකු නව යොවුන් වියට ළඟා වූ විට දී වෘෂණ මගින් ශුක්‍රාණු නිපදවීම ආරම්භ වේ.
- ශුක්‍රාණු යනු දරුවෙකු පිළිසිඳ ගැනීමට අවශ්‍ය වන පීතෘ සෛලයයි.
- වෘෂණ මගින් ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය නිපදවයි.
- ජීවිත කාලය පුරාම ශුක්‍රාණු නිපදවීම සිදු කරනු ලබයි.
- පියාගේ ලක්ෂණ ශුක්‍රාණු සෛලවල අන්තර්ගත වේ.
- ශුක්‍රාණුවලට පිහිනා යාමට හැකියාව පවතී.

## ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය



- ස්ත්‍රියකගේ උකුල් ප්‍රදේශය තුළ ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය පිහිටා ඇත.
- ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ අසිරිය පිළිබඳ කතා කිරීමේ දී,

## ➢ ආර්තව චක්‍රය

- ගැහැණු දරුවෙකු වැඩිවියට පත්වීමත් සමගම ආර්තව චක්‍රය ආරම්භ වේ.
- වැඩිවියට පත්වීමෙන් පසු සාමාන්‍යයෙන් දින 28කට වරක් ඩිම්බ කෝෂවලින් මාරුවෙන් මාරුවට ඩිම්බය බැගින් පිට වේ.
- චක්‍රයක් ලෙස මෙය සිදු වන බැවින් **ආර්තව චක්‍රය** ලෙස හැඳින්වේ.
- මාසික ඔසප් වීම සිදු වීමට දින 14ට පෙර ඩිම්බ කෝෂයෙන් ඩිම්බ පිට වේ.
- ඩිම්බය සංසේචනය වුවහොත් ගර්භාෂයේ පිළිසිඳ ගැනීමක් සිදු වේ.
- ඩිම්බය සංසේචනය නොවී ගර්භාෂයට පැමිණි විට ගර්භාෂය ඇතුළත ආස්තරයේ පටක කොටස් කැඩී බිඳී රුධිරයත් සමඟ ඉවත්ව යාම "**ආර්තවය**" හෙවත් "**ඔසප් වීම**" ලෙස හඳුන්වනු ලැබේ.
- පළමු වරට එය සිදුවීම "**මල්වර වීම**" හෙවත් "**වැඩිවියට පත්වීම**" ලෙස හැඳින්වේ.
- රුධිරය වහනය වීම සාමාන්‍යයෙන් දින 2 - 6 ක් පමණ දක්වා අතර කාලයක් පවතී.

## ➢ පිළිසිඳ ගැනීම

- ඩිම්බ කෝෂයකින් ඩිම්බයක් මේරීමට ලක් වී මෝචනය වූ විට එම ඩිම්බය පැලෝපීය නාලය ඔස්සේ ගමන් කරයි.
- යෝනි මාර්ගය ඔස්සේ එන ශුක්‍රාණු සෛල ගර්භාශය හරහා පැලෝපීය නාලය වෙත පිහිනා ගමන් කරයි.
- පැලෝපීය නාලය තුළ දී ශුක්‍රාණුවක් සහ ඩිම්බයක් එකට එකතු වීම "**සංසේචනය**" ලෙස හඳුන්වනු ලබයි.
- සංසේචනය වූ ඩිම්බය ගර්භාෂය වෙත ගමන් කර එහි ඇතුළත බිත්තිය තුළ තැන්පත් වේ. මෙය "**අධිරෝපණය**" ලෙස හැඳින්වේ. දරුවා බිහිවන තුරු මාස 09ක් පමණ ගර්භාෂය තුළ ආරක්ෂාකාරීව වැඩේ.
- දරුවා බිහිවීම යෝනි මාර්ගය

# ප්‍රජනක සෞඛ්‍යය

**"ප්‍රජනක සෞඛ්‍ය යනු තම වර්ගයා බෝ කිරීමේ දී පුද්ගලයකුට අවශ්‍ය වන ශාරීරික නිරෝගීකම, යහපත් මානසික තත්ත්වය හා යහපත් සමාජ තත්ත්වය හොඳින් පවත්වා ගැනීම වේ."**

## ප්‍රජනක සෞඛ්‍යයට බාධා ඇති කරන සාධක

- ලිංගික අපචාර හා අපයෝජනවලට ලක්වීම.
- නව යොවුන් වියේ ගැබ් ගැනීම්.
- සැලසුම් සහගත නොවූ ගැබ් ගැනීම්.
- ලිංගික සම්ප්‍රේෂණය වන රෝග.

## ➢ ලිංගික අපචාර හා අපයෝජන

**ලිංගික අපයෝජනය යනු** ළමයෙකුගේ සංවර්ධනය බාධා වන කුමන හෝ ලිංගික ක්‍රියාවකට ගොදුරු කර ගැනීම හෝ ඒ සඳහා කුමන ආකාරයකින් හෝ දායක වීම වේ.

**ලිංගික අපචාර යනු** ලිංගික අවයව ළමයින් ඉදිරියේ ප්‍රදර්ශනය කිරීම, ලිංගික අවයව ළමුන් ලවා ස්පර්ශයට ලක් කරවීම, ළමයින් යොදා ගනිමින් ලිංගිකත්වය හුවා දක්වන චිත්‍රපටි, ඡායාරූප හා ප්‍රකාශන නිකුත් කිරීම වේ.

### ලිංගික අපචාර හා අපයෝජනවලින් ආරක්ෂා වීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.

- ශරීරය අනිසි ලෙස කිසිම කෙනකුට ස්පර්ශ කිරීමට ඉඩ නොදීම.
- කිසිවෙකු ලිංගික අතවරයක් කිරීමට උත්සාහ කළහොත් විශ්වාසවන්ත අයෙකුට පැවසීම.
- පාළු හුදකලා ස්ථානවල තනිව යාමෙන් වැළකීම. අන්තර්ජාලය, ජංගම දුරකථන වැනි නව තාක්ෂණ ක්‍රමවේද අනිසි භාවිතයෙන් වැළකීම.

### ලිංගික අපචාර හා අපයෝජනවලට ලක්වීම නිසා ඇතිවිය හැකි ගැටලු.

- මානසික බිඳවැටීම් ඇති වීම.
- අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති වීම.
- අනවශ්‍ය ගැබ් ගැනීම් ඇති වීම.
- ලිංගික සම්ප්‍රේෂණ රෝග ඇති වීම.
- සමාජ අවමානයට ලක් වීම.
- කායික වශයෙන් හානි සිදු වීම.

### යොවුන් වියේ ගැබ් ගැනීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල.

- හදිසි ගැබ් ගැනීමක් ඇති වුවහොත් එයට මුහුණ දීම සඳහා කායික සූදානමක් නොතිබීම.
- මවක වීම සඳහා මානසික සූදානමක් නොතිබීම.
- ගැබ් කාලයේ දී සහ දරු ප්‍රසූතියේ දී සංකූලතා අති වීම.
- අධ්‍යාපන කටයුතු කඩාකප්පල් වීම.
- සමාජ අපවාද වලට ලක්වීම.

### ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග

ලිංගික එක් වීමක් හෝ ලිංගික ක්‍රියාවලියක් මගින් බෝවන රෝග ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වේ.

*උදා:- සුදු බිංදුම (ගොනෝරියා)*

*උපදංශය*

*හර්පීස්*

*ලිංගික ඉන්නන්*

*HIV / AIDS*

### ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග බෝ වීමෙන් ඇතිවිය හැකි ගැටලු.

- සමාජ අපවාදවලට ලක් වීම.
- අධ්‍යාපන කටයුතු කඩාකප්පල් වීම.
- ලිංගික අවයව වල තුවාල, සැරව ගැලීම්, වේදනා, කැසීම් ආදී සංකූලතා ඇති වීම.
- මානසික පීඩනය ඇති වීම.
- ප්‍රසූතියේ දී මවගෙන් දරුවාට ස්පර්ශ වන ඇතැම් විසබීජ නිසා දරුවන් අන්ධභාවයට පත් වීම.

### ප්‍රජනක සෞඛ්‍ය රැකගැනීම සඳහා වැදගත් වන සාධක.

- නිවැරදිව දැනුවත් වීම.
- සෞඛ්‍යවත් චර්යා අනුගමනය කිරීම.
- සමාජ වටිනාකම්වලට අනුව ජීවත් වීම.

## නිවැරදි දැනුවත් වීම

- ප්‍රජනක පද්ධතියේ ව්‍යුහය.
- ප්‍රජනක පද්ධතියේ ක්‍රියාකාරීත්වය.
- විවිධ වයස්වල දී ප්‍රජනක පද්ධතියේ ඇති වන වෙනස්කම්.
- නව යොවුන්වියේ හා ගර්භනී කාලයේ පෝෂණ අවශ්‍යතා.
- ලිංගික සම්ප්‍රේෂණය වන රෝග.

## සෞඛ්‍යවත් චර්යා

- පෞද්ගලික ස්වස්ථතාව පවත්වා ගැනීම.
- අප රටට ගැලපෙන කපු රෙදිවලින් නිම වූ පිරිසිදු යට ඇඳුම් භාවිතය.
- විවාහය තෙක් ලිංගික සම්බන්ධතා වලට යොමු නොවීම.
- ලිංගික සබඳතා තම විවාහක සහකරු, සහකාරිය ට පමණක් සීමා කිරීම.
- ප්‍රජනක පද්ධතිය ආශිත රෝග වල දී නිසි ප්‍රතිකාර ලබා ගැනීම.

## සමාජ වටිනාකම්

- විවාහ දිවියේ අර්ථවත් බව වටහා ගැනීම.
- විවාහක ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය, ආදරය, ගරු කිරීම වැනි ගුණාංග පවත්වා ගැනීම. මාතෘත්වයේ හා පීතෘත්වයේ වගකීම සහ වටිනාකම වටහා ගැනීම.
- විරුද්ධ ලිංගිකයන් කෙරෙහි සහෝදරත්වයෙන් කටයුතු කිරීම.